*සැ. යු.*- 2010.04.30 දින පළ වූ අංක 1,652 දරන *ගැසට් පත්‍රයේ* I-III සහ II කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,653 - 2010 මැයි මස 07 වැනි සිකුරාදා - 2010.05.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | 1022 |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1023 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීත් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 මැයි මස 14 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 අප්‍රේල් මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# වෙනත් පත්කිරීම් ආදිය

## බස්නාහිර පළාතේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

### පරිවාස නිලධාරීන් පත් කිරීම

1944 අංක 42 දරන වරදකරුවන් පරිවාස භාරයේ තැබීමේ ආඥාපනතේ 18(3) වගන්තිය යටතේ I වැනි තීරුවේ සඳහන් පරිවාස නිලධාරීන්, නමට ඉදිරියෙන් ඇති පරිදි II වැනි තීරුවේ සඳහන් අධිකරණ කොට්ඨාසවලට III වැනි තීරුවේ සඳහන් දින සිට පත් කර ඇති බව මෙයින් දන්වමි.

| | *I වැනි තීරුව*<br>*නම* | *II වැනි තීරුව*<br>*අධිකරණ කොට්ඨාසය* | *III වැනි තීරුව*<br>*දිනය* |
|---|---|---|---|
| *I වැනි ශ්‍රේණියේ පරිවාස නිලධාරීන්.-* | | | |
| 01. | ජී. රම්මුණිගේ මිය | හෝමාගම/කඩුවෙල | 2010.01.01 |
| 02. | ආර්. ඒ. පද්මසිරි මයා | හොරණ/බණ්ඩාරගම | 2010.01.01 |
| 03. | රංජනී සමරකෝන් මිය | ගල්කිස්ස/නුගේගොඩ | 2010.01.01 |
| 04. | ඩබ්. ආර්. සුරවීර මයා | ගම්පහ/අත්තනගල්ල/මීනුවන්ගොඩ | 2010.01.01 |
| 05. | මෙරිල් වීරසූරිය මයා | කොළඹ/මාලිගාකන්ද/කොටුව<br>මීගමුව/වත්තල/කණුවන | 2010.01.01 |
| 06. | එම්. එස්. හෙට්ටිආරච්චි මිය | පූගොඩ | 2010.01.01 |
| *II වැනි ශ්‍රේණියේ පරිවාස නිලධාරීන්.-* | | | |
| 01. | ජී. එස්. සමරතුංග මිය | අවිස්සාවේල්ල | 2010.01.01 |
| 02. | ජී. ඩබ්. කේ. ජයතිලක මයා | අවිස්සාවේල්ල | 2010.01.01 |
| 03. | එම්. සී. ජනන්ජනී මිය | අවිස්සාවේල්ල | 2010.01.01 |
| 04. | එස්. ආර්. කේ. සෝමසිරි මිය | හෝමාගම/කඩුවෙල | 2010.01.01 |
| 05. | පී. වී. පුෂ්පා මිය | හෝමාගම/කඩුවෙල | 2010.01.01 |
| 06. | අයි. මාතරගේ මිය | හෝමාගම/කඩුවෙල | 2010.01.01 |
| 07. | පී. ඒ. ඩී. එන්. චමින්ද මයා | හෝමාගම/කඩුවෙල | 2010.01.01 |
| 08. | ඊ. ඒ. ඒ. පියනන්දන මයා | ගල්කිස්ස/නුගේගොඩ | 2010.01.01 |
| 09. | කේ. සුසිල් ප්‍රියන්ත මයා | ගල්කිස්ස/නුගේගොඩ | 2010.01.01 |
| 10. | එම්. කේ. විල්සන් මයා | බම්බලපිටිය ළමා මහේස්ත්‍රාත් අධිකරණ කොට්ඨාසය | 2010.01.01 |
| 11. | ටී. ජී. ආර්. කළුපහන මිය | බම්බලපිටිය ළමා මහේස්ත්‍රාත් අධිකරණ කොට්ඨාසය | 2010.01.01 |
| 12. | උවිනි පියුමා පෙරේරා මිය | බම්බලපිටිය ළමා මහේස්ත්‍රාත් අධිකරණ කොට්ඨාසය | 2010.01.01 |
| 13. | ඒ. එච්. එල්. එන්. ඕ. ප්‍රේමරත්න මිය | බම්බලපිටිය ළමා මහේස්ත්‍රාත් අධිකරණ කොට්ඨාසය | 2010.01.01 |
| 14. | කේ. ජී. එස්. දමයන්ති මිය | බම්බලපිටිය ළමා මහේස්ත්‍රාත් අධිකරණ කොට්ඨාසය | 2010.01.01 |
| 15. | එච්. වී. සරත් මයා | බම්බලපිටිය ළමා මහේස්ත්‍රාත් අධිකරණ කොට්ඨාසය | 2010.01.01 |
| 16. | එන්. එස්. එම්. ඩී. ටී. කේ. සෙනවිරත්න මිය | කොළඹ/මාලිගාකන්ද/කොටුව | 2010.01.01 |
| 17. | එස්. ජී. එම්. සුජාතා මිය | කොළඹ/මාලිගාකන්ද/කොටුව | 2010.01.01 |
| 18. | එම්. ඩබ්. ඒ. පී. අයි. විජේසිංහ මිය | කොළඹ/මාලිගාකන්ද/කොටුව | 2010.01.01 |
| 19. | එස්. එච්. ශාන්ත මයා | කොළඹ/මාලිගාකන්ද/කොටුව<br>මීගමුව/වත්තල/කනුවන | 2010.01.01 |
| 20. | ආර්. සී. ජේ. පතිරණ මිය | කොළඹ/මාලිගාකන්ද/කොටුව | 2010.01.01 |
| 21. | එච්. එම්. එම්. පී. හේරත් මයා | කොළඹ/මාලිගාකන්ද/කොටුව | 2010.01.01 |
| 22. | එච්. ඩී. එච්. පී. පෙරේරා මිය | පානදුර/මොරටුව/කැස්බෑව | 2010.01.01 |
| 23. | පී. ඒ. එන්. එස්. විජේසේන මිය | පානදුර/මොරටුව/කැස්බෑව | 2010.01.01 |
| 24. | එම්. ඒ. ප්‍රියානි මිය | පානදුර/මොරටුව/කැස්බෑව | 2010.01.01 |
| 25. | ජේ. එම්. ජේ. ජයසිංහ මිය | පානදුර/මොරටුව/කැස්බෑව | 2010.01.01 |
| 26. | කේ. එස්. රම්‍යලතා මිය | පානදුර/මොරටුව/කැස්බෑව | 2010.01.01 |
| 27. | බී. ශ්‍රියාලතා මිය | පානදුර/මොරටුව/කැස්බෑව | 2010.01.01 |
| 28. | කේ. පුෂ්පකුමාර මයා | පානදුර/මොරටුව/කැස්බෑව | 2010.01.01 |
| 29. | එම්. සී. සී. මුණසිංහ මිය | හොරණ/බණ්ඩාරගම | 2010.01.01 |
| 30. | ඩබ්. එස්.කේ. පෙරේරා මිය | හොරණ/බණ්ඩාරගම | 2010.01.01 |

| | I වැනි තීරුව<br>නම | II වැනි තීරුව<br>අධිකරණ කොට්ඨාසය | III වැනි තීරුව<br>දිනය |
|---|---|---|---|
| 31. | ඩබ්. එස්. එස්. සමරසේකර මිය | හොරණ/බණ්ඩාරගම | 2010.01.01 |
| 32. | එච්. කේ. ටී. ප්‍රියංගනි මිය | හොරණ/බණ්ඩාරගම | 2010.01.01 |
| 33. | වී. එන්. ටී. කුරේ මිය | හොරණ/බණ්ඩාරගම | 2010.01.01 |
| 34. | එම්. එච්. එන්. ආර්. තිසේරා මයා | කළුතර | 2010.01.01 |
| 35. | ආර්. ඩී. වැලිපිටිය මිය | කළුතර | 2010.01.01 |
| 36. | පී. එන්. නිශාන්ති මිය | කළුතර | 2010.01.01 |
| 37. | එන්. පී. එම්. ලියනගේ මිය | කළුතර | 2010.01.01 |
| 38. | පී. ඒ. එස්. දමයන්ති මිය | කළුතර | 2010.01.01 |
| 39. | ඩී. එච්. රත්නායක මිය | ගම්පහ/අත්තනගල්ල/මිනුවන්ගොඩ | 2010.01.01 |
| 40. | එම්. එම්. එස්. ඒ. ගුණවර්ධන මිය | ගම්පහ/අත්තනගල්ල/මිනුවන්ගොඩ | 2010.01.01 |
| 41. | එම්. කේ. ඩී. ප්‍රියදර්ශනී මිය | ගම්පහ/අත්තනගල්ල/මිනුවන්ගොඩ | 2010.01.01 |
| 42. | කේ. ඒ. එම්. ඩී. ටී. සමරසේකර මිය | ගම්පහ/අත්තනගල්ල/මිනුවන්ගොඩ | 2010.01.01 |
| 43. | පී. ඒ. හේමන්තා කුමාරි මිය | ගම්පහ/අත්තනගල්ල/මිනුවන්ගොඩ | 2010.01.01 |
| 44. | ඩබ්. ඩී. සී. කුමුදුනී පෙරේරා මිය | ගම්පහ/අත්තනගල්ල/මිනුවන්ගොඩ | 2010.01.01 |
| 45. | ඒ. ඒ. නයනා නන්දනි මිය | ගම්පහ/අත්තනගල්ල/මිනුවන්ගොඩ | 2010.01.01 |
| 46. | පී. ඒ. වී. එස්. ගුණතිලක මිය | ගම්පහ/අත්තනගල්ල/මිනුවන්ගොඩ | 2010.01.01 |
| 47. | කේ. ජී. දමයන්ති මිය | පූගොඩ | 2010.01.01 |
| 48. | එස්. ඩබ්. සී. කේ. සූරියප්පෙරුම මිය | පූගොඩ | 2010.01.01 |
| 49. | එච්. එම්. පුෂ්පකාන්ති මිය | පූගොඩ | 2010.01.01 |
| 50. | එස්. ඩී. ඩී. සුසන්ත මයා | පූගොඩ | 2010.01.01 |
| 51. | ඕ. ජී. නයනලතා මිය | මතුගම | 2010.01.01 |
| 52. | එම්. ඩී. එන්. ශිරානි මිය | මතුගම | 2010.01.01 |
| 53. | පී. ඒ. ඩී. ඒ. ටී. පැලවත්ත මිය | මතුගම | 2010.01.01 |
| 54. | ජී. ටී. අනුර කුමාර මයා | මතුගම | 2010.01.01 |
| 55. | ඩබ්. සී. ප්‍රියංගනී මිය | මතුගම | 2010.01.01 |
| 56. | පූජ්‍ය මංගල සද්ධානන්ද හිමි | මීගමුව/වත්තල/කණුවන | 2010.01.01 |
| 57. | එන්. අයි. දීපිකා ගුණවර්ධන මිය | මීගමුව/වත්තල/කණුවන | 2010.01.01 |
| 58. | ඩී. එම්. කල්‍යාණි මිය | මීගමුව/වත්තල/කණුවන | 2010.01.01 |
| 59. | ඇස්. ශ්‍රීනාත් මෙන්ඩිස් මයා | බස්නාහිර පළාතේ සියළුම අධිකරණ කොට්ඨාස | 2010.01.01 |
| 60. | යූ. ජී. ඒ. ජයරත්න මයා | බස්නාහිර පළාතේ සියළුම අධිකරණ කොට්ඨාස | 2010.01.01 |

ජී. පී. ඩී. සෝමරත්න,
පරිවාස හා ළමා රක්ෂක සේවා කොමසාරිස්,
බස්නාහිර පළාත.

2010 ක් වූ අප්‍රේල් මස 20 වැනි දින,
පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව (බ.ප.)

05-69

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පළාත් ආදායම් සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ බදු නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ තරග විභාගය - 2009

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ, පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ, පළාත් ආදායම් සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ බදු නිලධාරි තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

02. 02.1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (IV) අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 16,720 - 10 x 320 - 11 x 365 - 15 x 450 - රු. 30,685 වේ. (MN -5 2006 A හි 1 වන පියවර)

02.2 *වයස් සීමාව.-* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 30 ට අඩු විය යුතුය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ. ඔවුන් සිට අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

02.3 *සේවා කොන්දේසි.-* අනුමත සේවා ව්‍යවස්ථාව අනුව සේවා කොන්දේසි තීරණය වේ. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

03. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.-*

*(අ)* ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා තිබීම ;

*හෝ*

වරලත් ගණකාධිකරණ ආයතනයේ මධ්‍ය පරීක්ෂණය සමත්වීම සහ ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණය හෝ වාණිජ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ මධ්‍ය පරීක්ෂණය සමත්වීම.

*හා*

පහත සඳහන් පරිදි අ.පො.ස. (සා./පෙළ) විභාගයේදී ද්විතීය භාෂාවලින් සාමාර්ථයක් ලබා තිබීම.

* සිංහල මාධ්‍යයෙන් පෙනී සිටින අයදුම්කරුවන් - දෙමළ හෝ ඉංග්‍රීසි විෂයය
* දෙමළ මාධ්‍යයෙන් පෙනී සිටින අයදුම්කරුවන් - සිංහල හෝ ඉංග්‍රීසි විෂයය
* ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිටින අයදුම්කරුවන් - සිංහල හෝ දෙමළ විෂයය

04. *අපේක්ෂකයින්.-*

04.1 ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

04.2 මනා චරිතයකින් යුක්ත විය යුතුය.

04.3 මෙම තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා කායික හා මානසික වශයෙන් සුදුසු විය යුතුය.

04.4 අයදුම්කරුවන් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය සනාථ කළ යුතු අතර, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2010.05.31 දිනට බස්නාහිර පළාත් තුළ අවම වශයෙන් අවු 03 ක කාලයක් ස්ථිර පදිංචිය ඇති අයදුම් කරුවන් විය යුතුය. මේ සඳහා ස්ථිර පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය.-* පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව නොඉක්මවා අයදුම්පත් ලැබුණු අවස්ථාවක තේරීම් මණ්ඩලයක් මගින් නියමිත සුදුසුකම් පරීක්ෂා කර බැලීමෙන් පසුව බඳවා ගනු ලැබේ. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා අයදුම්පත් ලැබුණු අවස්ථාවකදී ලිඛිත පරීක්ෂණයකින් තීරණය වන කුසලතාවය මත බඳවා ගනු ලැබේ. බඳවා ගැනීමේ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 විධිවිධාන අදාළ වේ. සමාන ලකුණු ලබා ඇති අපේක්ෂකයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඇත්නම් සුදුස්සකු තෝරා ගැනීමේ අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

06. දැනට වාර්තා වී ඇති පුරප්පාඩු පිරවීම හා තරඟ විභාගයෙන් පසු වාර්තා වන පුරප්පාඩු, යථෝක්ත විභාගයෙන් 16 ඡේදයේ දක්වා ඇති පරිදි සමත් අයවළුන් සිටීනම් එම අයගෙන් පිරවීම පිළිබඳ අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

07. විභාග ගාස්තු වශයෙන් රු. 350 ක් පළාත් හා ආදායම් ශීර්ෂ 20-03-90-01 ට බැරවන පරිදි ළඟම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද බ. ප. 1 ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතුය. එසේ මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට ගෙවා ලබා ගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බව සැලකිය යුතුය.

08. *ඉල්ලුම් කළ යුතු පිළිවෙල.-*

08.1 මෙම නිවේදනයේ අග ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඒ 4 ප්‍රමාණයේ (සෙ. මී. 21 x 29) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කර ගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2010.05.31 දිනට පෙර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.) නිදහස් චතුරස්‍රය, කොළඹ 07, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ, III පන්තියේ II ශ්‍රේණියේ බඳු නිලධාරි තනතුරට බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

09. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2010.05.31 වේ.

10. *වෙනත් කොන්දේසි.-* බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට අදාළව ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ සියළු කොන්දේසීන්ට ඔබ යටත් වේ.

11. නිවේදනයේ ඇති සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත විභාග ගාස්තු ගෙවා නියමිත දින හෝ එදිනට පෙර අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියළුම අයදුම්කරුවන්ට තරඟ විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. තරඟ විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා අදාළ නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවක දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාළ සියළු සුදුසුකම් 2010.05.31 දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.

12. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය.*- තමා පෙනී සිටින විෂයය සඳහා විභාගශාලා භාර නිලධාරියාට අයදුම්කරු තම අනන්‍යතාවය ඒත්තු ගැන්විය යුතුය. මේ සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් පිළිගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

2. වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

*සටහන.*- විභාග ශාලාවේදී සිය හැඳින්වීමේ පත ඉදිරිපත් කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වුවහොත් ඔවුන් නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

13. කිසියම් අපේක්ෂකයෙකුට සිය ප්‍රවේශ පත්‍රය විභාගයට යටත් පිරිසෙයින් දින 07 කට පෙර නොලැබුණහොත් ඒ බව වහාම ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.), නිදහස් චතුරස්‍රය, කොළඹ 07 යන ලිපිනයට දැන්විය යුතුයි. එසේ දැනුම් දීමේදී පහත විස්තර ඉදිරිපත් කළ යුතුයි.

(a) විභාගයේ නම :——————,
(b) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :——————,
(c) ලිපිනය :——————,
(d) අයදුම්පත්‍රය යොමු කළ ලිපිනය, ලියාපදිංචි තැපැල් අංකය හා දිනය :——————.

14. යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. පත්වීම ලැබීමෙන් පසු හෝ දැන දැනම සාවද්‍ය, තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

15. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් අනාවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

16. *ලිඛිත පරීක්ෂණයේ විෂයය නිර්දේශය.*- මෙම පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විතය

1. සාමාන්‍ය දැනීම - කාලය පැය 01 යි, ලකුණු 100

2. බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 යි, ලකුණු 100

සුදුසුකම් ලැබීම සඳහා අවම වශයෙන් එක් එක් ප්‍රශ්න පත්‍රයකට ලකුණු 40% ක් බැගින් ද ප්‍රශ්න පත්‍ර දෙක සඳහා සාමාන්‍ය ලකුණු 50% ක් ද ලබා ගත යුතුය.

වී. රාජපක්ෂ,
ලේකම්.

2010 අප්‍රේල් මස 19 වැනි දින,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත,

*ආදර්ශ අයදුම් පත්‍රය*

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පළාත් ආදායම් සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ බදු නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ තරග විභාගය - 2009**

විභාග අංකය : [ ]

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. (අ) මුලකුරු සමග නම :——————.
(ආ) සම්පූර්ණ නම :——————.
(ඇ) ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

02. ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :——————.

03. *(i)* ස්ථිර ලිපිනය :——————.

*(ii)* ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : (අදාළ කොටුව තුල "√" ලකුණ යොදන්න)

| කොළඹ | | ගම්පහ | | කළුතර | |
|---|---|---|---|---|---|

*(iii)* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2010.05.31 දිනට අදාළ දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිය

| අවු : | | | මාස | | | දින | | |
|---|---|---|---|---|---|---|---|---|

iv. දුරකථන අංකය : පෞද්ගලික :——————. රාජකාරි :——————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය : (අදාළ කොටුව තුල "√" ලකුණ යොදන්න)

| ස්ත්‍රී | | පුරුෂ | |
|---|---|---|---|

05. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (අදාල කොටුව තුල "√" ලකුණ යොදන්න)

| සිංහල | | දෙමළ | | ඉංග්‍රීසි | |
|---|---|---|---|---|---|

06. උපන් දිනය : වර්ෂය :——————, මාසය :——————, දිනය :——————.

*(i)* අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2010.05.31 දිනට වයස : අවු :——————, මාස :——————, දින :——————,

*(ii)* ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින්ද/ලියාපදිංචි වීමෙන්ද? :——————.

07. අධ්‍යාපන සුදුසුකම් :

අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 3 "අ" යටතේ,

(අ) *(i)* ලබා ඇති උපාධිය :——————,

*(ii)* උපාධිය හැදෑරූ විශ්ව විද්‍යාලයේ නම :——————,

*(iii)* ලබා ඇති සාමාර්ථය :——————,

*(iv)* උපාධිය වලංගු දිනය :——————.

(ආ) *(i)* වරලත් ගණකාධිකරණ ආයතනයේ මධ්‍ය පරීක්ෂණය සමත් වී ඇත්ද? :——————,

*(ii)* එසේ නම් දිනය :——————.

(ඇ) *(i)* ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ මධ්‍ය පරීක්ෂණය සමත් වී ඇත් ද? :——————,

*(ii)* එසේ නම් දිනය :——————.

(ඈ) *(i)* ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ වාණිජ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ මධ්‍ය පරීක්ෂණය සමත් වී ඇත්ද? :——————,

*(ii)* එසේ නම් දිනය :——————.

(ඉ) *(i)* අ.පො.ස. (සා.පෙළ) සාමාර්ථය ලබා ඇති ද්වීතිය භාෂාව :——————,

*(ii)* විභාගයට පෙනී සිටි වර්ෂය :——————,

*(iii)* විභාග අංකය :——————,

*(iv)* ලබා ඇති සාමාර්ථය :——————.

මෙම තොරතුරු පැහැදිලිව හා නිවැරදිව සඳහන් කර නොමැති නම් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :——————.

දිනය :——————.

ලදුපත් ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :——————.

| |
|---|
| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙනසේ අලවන්න. |

09. .......................................... වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය, යැයි සොයා ගනු ලැබුවහොත් පළාත් ආදායම් සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ බඳු නිලධාරි තනතුරට පත්කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූල කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරවම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*
*(අනවශ්‍ය වචන කපා හරින්න)*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන......... මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය ................................... දින මා ඉදිරිපිට දී ඔහු/ඇයගේ අත්සන තැබූ බවත්, මම සහතික කරමි.

සහතික කරන අයගේ නම :——————,

අත්සන :——————,

තනතුර හා නිල මුද්‍රාව :——————.

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු දිව්රුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරි බලය ලත් නිලධාරියෙකු හෝ වර්ෂයකට රු. 2,37,060 නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් සහතික කළ යුතුයි.)

*රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :*
*(අනවශ්‍ය වචන කපා හරින්න)*

...................................................... මයා/මිය/මෙනවිය දැනට.......................................... අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ.......................................... වශයෙන් ස්ථිර සේවයේ යෙදී සිටින බවත් ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගන්වා ඇති/නැති බවත්, තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා ඇති/නැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිය/නොහැකිය.

——————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය :——————.

05-143/1

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පළාත් ආදායම් සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ පළාත් තක්සේරුකරු තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2009**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පළාත් ආදායම් සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ තක්සේරුකරු තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

02. 02.1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1050 - රු. 53,555 වේ. (SL -1- 2006 හි 1 වන පියවර)

02.2 *වයස් සීමාව.-* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 30 ට අඩු විය යුතුය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමා අදාළ නොවේ. ඔවුන් සිය අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කල යුතුය.

02.3 *සේවා කොන්දේසි.-* අනුමත සේවා ව්‍යවස්ථාව අනුව සේවා කොන්දේසි තීරණය වේ. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

03. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.-*

*(අ)* ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්ව විද්‍යාලයක පළමු පෙළ හෝ දෙවන පෙළ උපාධියක් සහිත උපාධිධාරීන්,

*හෝ*

නීතිඥයින්, වරලත් හෝ ඒකාබද්ධ හෝ ලියාපදිංචි ගණකාධිකාරීන්,

*හෝ*

පළාත් ආදායම් සේවයේ වසර 03 ක සේවා කාලයක් ඇති සේවය ස්ථිර කර ඇති III පන්තියේ II ශ්‍රේණියේ බදු නිලධාරීන්,

*හෝ*

පළාත් ආදායම් සේවයේ III පන්තියේ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ බදු නිලධාරීන්

*හෝ*

පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ වසර 03 කට නොඅඩු සේවයක් ඇති හා සේවය ස්ථිර කර ඇති පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ඇති උපාධිධාරීන් හෝ නීතිඥයින් වන නිලධාරීන් (ගරු ආණ්ඩුකාරතුමා විසින් නව සේවා ව්‍යවස්ථාව අනුමත කර ඇති 2009.04.07 දිනට පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන්ට ඉහත සේවා කාලය නොසලකා පවතින සේවා ව්‍යවස්ථාව අනුව හිමිව ඇති විභාගයට පෙනී සිටීමේ යෝග්‍යතාවය හිමි වේ.)

*හා*

පහත සඳහන් පරිදි අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ද්වීතීය භාෂාවකින් සාමාර්ථයක් ලබා තිබීම.

* සිංහල මාධ්‍යයෙන් පෙනී සිටින අයදුම්කරුවන් - දෙමළ හෝ ඉංග්‍රීසි විෂයය
* දෙමළ මාධ්‍යයෙන් පෙනී සිටින අයදුම්කරුවන් - සිංහල හෝ ඉංග්‍රීසි විෂයය
* ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිටින අයදුම්කරුවන් - සිංහල හෝ දෙමළ විෂයය

04. *අපේක්ෂකයින්.-*

04.1 ශ්‍රී ලාංකික පුරුවැසියෙකු විය යුතුය.

04.2 මනා චරිතයකින් යුක්ත විය යුතුය.

04.3 මෙම තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා කායික හා මානසික වශයෙන් සුදුසු විය යුතුය.

04.4 අයදුම්කරුවන් බස්නාහිර පළාත තුල ස්ථිර පදිංචිය සනාථ කළ යුතු අතර, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2010.05.31 දිනට බස්නාහිර පළාත තුළ අවම වශයෙන් අවු. 03 ක කාලයක් ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් විය යුතුය. මේ සඳහා ස්ථිර පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය.-* පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව නොඉක්මවා අයදුම්පත් ලැබුණු අවස්ථාවක තේරීම් මණ්ඩලයක් මගින් නියමිත සුදුසුකම් පරීක්ෂා කර බැලීමෙන් පසුව බඳවා ගනු ලැබේ. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා අයදුම්පත් ලැබුණු අවස්ථාවකදී ලිඛිත පරීක්ෂණයකින්

තීරණය වන කුසලතාවය මත බඳවා ගනු ලැබේ. බඳවා ගැනීමේ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 විධිවිධාන අදාළ වේ. සමාන ලකුණු ලබා ඇති අපේක්ෂකයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඇත්නම් සුදුස්සකු තෝරා ගැනීමේ අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

06. දැනට වාර්තා වී ඇති පුරප්පාඩු පිරවීම හා තරග විභාගයෙන් පසු වාර්තා වන පුරප්පාඩු, යථොක්ත විභාගයෙන් 16 ඡේදයේ දක්වා ඇති පරිදි සමත් අයවළුන් සිටීනම් එම අයගෙන් පිරවීම පිළිබඳ අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

07. විභාග ගාස්තු වශයෙන් රු. 350 ක් පළාත් හා ආදායම් ශීර්ෂ 20-03-90-01 ට බැරවන පරිදි ළඟම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද බ. ප. 1 ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතුය. එසේ මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට ගෙවා ලබා ගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බව සැලකිය යුතුය.

08. *ඉල්ලුම් කළ යුතු පිළිවෙල.-*

08.1 මෙම නිවේදනයේ අග ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඒ 4 ප්‍රමාණයේ (සෙ. මී. 21 x 29) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කර ගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2010.05.31 දිනට පෙර "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.) නිදහස් චතුරස්‍රය, කොළඹ 07" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ, "II පන්තියේ II ශ්‍රේණියේ තක්සේරුකරු තනතුරට බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

09. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2010.05.31 වේ.

10. *වෙනත් කොන්දේසි.-* බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට අදාළව ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ සියළු කොන්දේසීන්ට ඔබ යටත් වේ.

11. නිවේදනයේ ඇති සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත විභාග ගාස්තු ගෙවා නියමිත දින හෝ එදිනට පෙර අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියළුම අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා අදාළ නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවක දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාළ සියළු සුදුසුකම් 2010.05.31 දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.

12. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය.-* තමා පෙනී සිටින විෂයය සඳහා විභාග ශාලා භාර නිලධාරියාට අයදුම්කරු තම අනන්‍යතාවය ඒත්තු ගැන්විය යුතුය. මේ සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් පිළිගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

2. වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

*සටහන.-* විභාග ශාලාවේදී සිය හැඳින්වීමේ පත ඉදිරිපත් කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වුවහොත් ඔවුන් නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

13. කිසියම් අපේක්ෂකයෙකුට සිය ප්‍රවේශ පත්‍රය විභාගයට යටත් පිරිසෙයින් දින 07 කට පෙර නොලැබුණහොත් ඒ බව වහාම "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.), නිදහස් චතුරස්‍රය, කොළඹ 07" යන ලිපිනයට දැන්විය යුතුයි. එසේ දැනුම් දීමේදී පහත විස්තර ඉදිරිපත් කළ යුතුයි.

(*a*) විභාගයේ නම :——————.

(*b*) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :——————.

(*c*) ලිපිනය :——————.

(*d*) අයදුම්පත්‍රය යොමු කළ ලිපිනය, ලියාපදිංචි තැපැල් අංකය හා දිනය :——————.

14. යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. පත්වීම ලැබීමෙන් පසු හෝ දැන දැනම සාවද්‍ය, තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිවැරදි තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

15. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් අනාවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

16. *ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය.*- මෙම පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර 03 කින් සමන්විතය.

(1) අවබෝධය - කාලය පැය 01 යි (ලකුණු 100)
(2) සාමාන්‍ය දැනීම - කාලය පැය 01 යි (ලකුණු 100)
(3) බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 යි (ලකුණු 100)

සුදුසුකම් ලැබීම සඳහා අවම වශයෙන් එක් එක් ප්‍රශ්න පත්‍රයකට ලකුණු 40% ක් බැගින් ද, ප්‍රශ්න පත්‍ර තුන සඳහා සාමාන්‍ය ලකුණු 50% ක් ද ලබා ගත යුතුය.

වී. රාජපක්ෂ,
ලේකම්.

2010 අප්‍රේල් මස 19 වැනි දින,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත,

*ආදර්ශ අයදුම්පත්‍රය*

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පළාත් ආදායම් සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ පළාත් තක්සේරුකරු තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2009**

විභාග අංකය [ ]

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. අ. මුලකුරු සමග නම :—————.
ආ. සම්පූර්ණ නම :—————.
ඇ. ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

02. ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :—————.

03. *(i)* ස්ථිර ලිපිනය :—————.

*(ii)* ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : (අදාළ කොටුව තුල "√" ලකුණ යොදන්න)

කොළඹ [ ] ගම්පහ [ ] කළුතර [ ]

*(iii)* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2010.05.31 දිනට අදාළ දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිය :

අවුරුදු [ ][ ] මාස [ ][ ] දින [ ][ ]

*(iv)* දුරකථන අංකය - පෞද්ගලික :—————. රාජකාරි :—————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ කොටුව තුල "√"ලකුණ යොදන්න)

ස්ත්‍රී [ ] පුරුෂ [ ]

05. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (අදාල කොටුව තුල "√"ලකුණ යොදන්න)

සිංහල [ ] දෙමළ [ ] ඉංග්‍රීසි [ ]

06. උපන් දිනය : වර්ෂය :—————. මාසය :—————. දිනය :—————.

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2010.05.31 දිනට වයස : අවුරුදු :—————. මාස :—————. දින :—————.

(ii) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින්ද/ලියාපදිංචි වීමෙන්ද? :—————.

07. අධ්‍යාපන සුදුසුකම් :

අ. *(i)* ලබා ඇති උපාධිය :—————.
*(ii)* උපාධිය හැදෑරූ විශ්වවිද්‍යාලයේ නම :—————.

(iii) ලබා ඇති සාමාර්ථය :————.

(iv) උපාධිය වලංගු දිනය :————.

ආ. (i) ඔබ නීතිඥයෙකු/වරලත් හෝ ඒකාබද්ධ හෝ ලියාපදිංචි ගණකාධිකාරිවරයෙක්ද යන වග ? :————.

ඇ. (i) පළාත් ආදායම් සේවයේ III/II බදු නිලධාරි තනතුරට පත් වූ දිනය :————.

(ii) පත්වීම ස්ථිර කළ දිනය :————.

(iii) පළාත් ආදායම් සේවයේ III/I ජ්‍යෙෂ්ඨ බදු නිලධාරි තනතුරට පත් වූ දිනය :————.

(iv) පළාත් ආදායම් සේවයේ වසර 03 ක සේවා කාලය සම්පූර්ණ වන දිනය :————.

ඈ. (i) බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ දරණ/දැරූ තනතුර :————.

(ii) එම තනතුරෙහි ස්ථිර කළ දිනය :————.

(iii) බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ සේවා කාලය ........................... සිට ......................... දක්වා

(iv) වර්තමාන සේවා ස්ථානය :————.

ඉ. (i) අ.පො.ස. (සා.පෙළ) සාමාර්ථය ලබා ඇති ද්විතීය භාෂාව :————.

(ii) විභාගයට පෙනී සිටි වර්ෂය :————.

(iii) විභාග අංකය :————.

(iv) ලබා ඇති සාමාර්ථය :————.

*මෙම තොරතුරු පැහැදිලිව හා නිවැරදිව සඳහන් කර නොමැති නම් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.*

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :————.
දිනය :————.
ලදුපත් ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.

| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙනසේ අලවන්න. |
|---|

09. ............................................................................ වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය, යැයි සොයා ගනු ලැබුවහොත් පළාත් ආදායම් සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ තක්සේරුකරු තනතුරට උසස්වීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූල කටයුතු කරනු ලැබීම්වලට ද හැකි බව මම හොඳාකාරවම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.-
*(අනවශ්‍ය වචන කපා හරින්න)*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................................. මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය ...................................... දින මා ඉදිරිපිට දී ඔහු/ඇයගේ අත්සන තැබූ බවත්, මම සහතික කරමි.

සහතික කරන අයගේ නම :————.
අත්සන :————.
තනතුර හා නිල මුද්‍රාව :————.

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු දිව්රුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරි බලය ලත් නිලධාරියෙකු හෝ වර්ෂයකට රු. 237,060 නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් සහතික කළ යුතුයි.)

**රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**

*(අනවශ්‍ය වචන කපා හරින්න)*

.................................................................................................. මයා/මිය/මෙනවිය දැනට.................................................................................................. අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ.................................................................................................. වශයෙන් ස්ථිර සේවයේ යෙදී සිටින බවත් ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගන්වා ඇති/නැති බවත්, තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා ඇති/නැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිය/නොහැකිය.

——————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය :——————.

05-143/2

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

*** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

*(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)*

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | *පිටපතක මිළ* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2010** | | | | | |
| මැයි | 2010.05.07 | සිකුරාදා | 2010.04.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.05.14 | සිකුරාදා | 2010.04.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.05.21 | සිකුරාදා | 2010.05.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.05.26 | බදාදා | 2010.05.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජුනි | 2010.06.04 | සිකුරාදා | 2010.05.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.06.11 | සිකුරාදා | 2010.05.26 | බදාදා | දහවල් | 12.00 |
| | 2010.06.18 | සිකුරාදා | 2010.06.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.06.24 | බ්‍රහස්පතින්දා | 2010.06.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2010.07.02 | සිකුරාදා | 2010.06.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.07.09 | සිකුරාදා | 2010.06.24 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2010.07.16 | සිකුරාදා | 2010.07.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.07.23 | සිකුරාදා | 2010.07.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.07.30 | සිකුරාදා | 2010.07.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.